# සෙනුරගේ කථාව



මිනුදි පූජාගොඩ

**IS29074**

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 10 20

Activate Wi
Go to Settings t
Activate
Go to Settir

## පසුවදන

නුතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නුතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20

සෙනුර කම්මැලි නැති ගොඩක් හොඳ දක්ෂ ළමයෙක්. පාසලේ වැඩත් ඉතාම හොඳින් කරනවා. ගෙදර වැඩ වලටත් නිතරම උදව් කරනවා.

එක දවසක් සෙනුරට බඩේ අමාරුවක් හැදුනා ඉතිං සෙනුරගේ අම්මා සෙනුවරව බෙහෙත් ගන්න ඉස්පිරිතාලේට එක්කගෙන ගියා.

ඉස්පිරිතාලේ සෙනඟ පිරිලා හැම බංකුවකම ලෙඩ්ඩු ඉඳගෙන ඉන්නවා.

එතන රූපවාහිනි යන්ත්‍රයක වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවා.

ඉතිං සෙනුර එයාගේ වාරය එනතුරු රූපවාහිනිය දිහා බලාගෙන හිටියා.

ක්ෂය රෝගය ගැන කියවෙන ලස්සන කථාවක් රූපවාහිනියේ විකාශනය වෙනවා.

ඒක දිහා බලාගෙන ඉන්නකොට සෙනුරට මතක් වුනේම අත්තම්මව.

අත්තම්මාට මේ ළඟකදී ඉඳලා ගොඩාක් කැස්ස.
රෑට රෑට සීතලයි උණ වගේ කියලත් කියනවා.

ඇඟත් කෙට්ටු වෙලා.......

කෑම කන්නෙත් අප්පිරියාවෙන්.......

කොහොමහරි එදා බෙහෙත් අරගෙන ගෙදර ආපු සෙනුර දුවගෙන ගියේ අත්තම්මා ළඟට.

අත්තම්මේ ඔයාට ගොඩක් අමාරුද?

ඔව් පුතේ  මේ දවස් වල කැස්ස නිසා මට හරි අමාරුයි කිසිම වැඩක් කර ගන්න බැහැ.

සිල් ගන්න පන්සල් යන්නත් බැරි වුණා.අත්තම්මා බොහොම දුකෙන් කිව්වා.

“අත්තම්මේ අපි හෙටම ළය රෝහලට යන්න ඕනේ”

සෙනුර අම්මාටත් කරුණු පැහැදිලි කරලා දීලා අත්තම්මාත් එක්කරගෙන පහුවදාම ළය රෝහලට ගියා.

එතන දි අත්තම්මව දොස්තර මාමා පරීක්ෂා කලා. පරීක්ෂණ ගොඩක් කලා.

ඊටපස්සේ හොයාගත්තා අත්තම්මට හැදිලා තියෙන්නේ ක්ෂය රෝගය කියලා.

ඒ වේලාවේ අත්තම්මා වගේම සෙනුරගේ අම්මත් ගොඩක් බය වුණා.

එත් ක්ෂය රෝගය කියන්නේ ඉස්සර වගේ සමාජයෙන් කොන් කරන්න ඕනි ලෙඩක් වත්, බය වෙනන් ඕන ලෙඩක්වත්, නෙවෙයි කියලාත් මාස 06 ක් බෙහෙත් බිව්වාම ක්ෂය රෝගය හොඳටම හොඳ වෙනවා කියලත් නර්ස් නැන්දා කියලා දුන්නා.

ඒ වගෙම අත්තම්මාට දිනපතා බෙහෙත් ටික නිවැරදිව බොන විදියත් කියලා දුන්නා.

- අත්තම්මා කහින කොට එන සෙම හැමතැනම දාන්න එපා.
- හැමවෙලේම මුඛ ආවරණයක් දාගෙන ඉන්න.
- හොඳ පෝෂණීය ආහාර ගන්න.

එහෙම ගොඩක් උපදෙස් දුන්නා.මාස 02 ක් විතර බෙහෙත් බොනකොට අත්තම්මාට ගොඩක් දුරට හොඳ වුණා.

කැස්ස නතර වුණා.

කෑම කන්නත් පුළුවන් වුනා.

ඉතිං අත්තම්මාට ඉස්සර වගෙම පන්සල් යන්නත් පුළුවන් වුණා.

අත්තම්මා සෙනුරට පිං දුන්නා. අම්මයි තාත්තායි සෙනුරට ප්‍රසංශා කලා. සෙනුරට ගොඩක් සතුටුයි.

